# මූලික විද්‍යා පරීක්ෂණවලටම විශේෂිත වූ:

# සීතල හන්තාන කඳු පියස පාමුල පිහිටි ජාතික මූලික අධ්‍යයන ආයතනය

විද්‍යාවේ දියුණුවත් සමඟ ලෝකය ශීඝ්‍ර දියුණුවක් කරා පියනගමින් සිටී. එයට සමගාමීව ශ්‍රී ලංකාවද නොයෙක් ක්ෂේත්‍ර ඔස්සේ විවිධ ක්‍රියාකාරකම් කරමින් ලෝකය සමඟ ඉදිරියට යාමට දැඩි කැපවීමක් කරයි. සංවර්ධන ක්‍රියා දාමයේදී සමස්තයක් වශයෙන් ගතහොත් ප්‍රමුඛත්වයක් දෙන්නේ විද්‍යාවටයි. විද්‍යාවට මුල් තැන නොදුන් කිසිම රටක් දියුණු වී නැත. මොවුන් විද්‍යා පර්යේෂණ සඳහා විශාල ශ්‍රමයක් සහ ධනයක් වැය කර තිබේ. මෙහිදී ව්‍යවහාරික පර්යේෂණ සහ මූලික පර්යේෂණ වශයෙන් දෙයාකාරයකින් පර්යේෂණ සිදු කොට තම රටේ උන්නතිය උදෙසා භාවිතයට ගෙන ඇත.

විද්‍යාවේ සංකල්ප මිනිසාගේ අභිවෘද්ධිය උදෙසා ප්‍රායෝගික භාවිතයට ගත හැකි ආකාරය ව්‍යවහාරික පර්යේෂණ වශයෙන්ද විද්‍යාවේ නවතම කරුණු සොයා සිදු කෙරෙන පර්යේෂණ මූලික පර්යේෂණ ලෙසද යොදා ගනිමින් පර්යේෂණ සිදු කරයි. මෙහි මූලික පර්යේෂණ සිදු කිරීම රටකට ඉතා වැදගත් වන්නේ නවෝත්පාදන ආර්ථිකයේ මූලාරම්භය සැපයීමට මෙය ඉතා වැදගත් වන බැවිනි. මෙහිදී එම රටවල තිබෙන සම්පත් භාවිතා කොට ශීඝ්‍ර සංවර්ධනයක් කරා ගෙනයාමට පහසුවෙන්ම හැකියාව ලැබෙනු ඇත. ලෝකයේ බොහෝ දියුණු රටවල මූලික විද්‍යා පර්යේෂණ සඳහා විශේෂිත වූ ආයතන පිහිටුවා ඇත. ශ්‍රී ලංකාවේ මේ සඳහා පිහිටුවා ඇති එකම ආයතනය වන්නේ 1981 වසරේ මහනුවර හන්තානේ පිහිටවනු ලැබූ ජාතික මූලික අධ්‍යයන ආයතනයයි. මේ ආයතනය මගින් මෙතෙක් මූලික පර්යේෂණ විශාල ප්‍රමාණයක් සිදු කර ඇත. මේ පර්යේෂණයන්හි ප්‍රතිඵල ලබාගැනීමට කාලයක් ගත වුවද නව සොයා ගැනීම සඳහා මේ වන විට පේටන්ට් බලපත්‍ර පහළොවක් පමණ ලබා තිබීම එම ආයතනය කෙටිකලකින් ලබා ඇති සුවිශේෂී ජයග්‍රහණයකි. ලොව ප්‍රථම ජෛව පොහොර නිෂ්පාදනය කර ඇත්තේද මේ ආයතනය මගිනි.

මූලික පර්යේෂණවලට පමණක් සීමා නොකර අනාගත පරපුරටද මේ දැනුම ආයාද කිරීමට මෙහි පාලනාධිකාරිය ගෙන ඇති ක්‍රියාමාර්ග පැසසුම් සහගතය. ලොව සුප්‍රකට ශ්‍රී ලාංකික විද්‍යාඥයන්ගේ ආභාෂයන්ගෙන් පෝෂණය වූ මේ ආයතනය රටේ ජීවනාලිය වන් දරු පරපුර සමඟ අත්වැල් බැඳ ගනිමින් දැනුම බෙදා ගනිමින් ලෝකය සමඟ පවත්වන්නාවූ සහ සම්බන්ධතාව මෙරට අනාගතයේ පෙරනිමිති විදහා දක්වයි.

ජාතික මූලික අධ්‍යයන ආයතනය සීතල හන්තාන කඳු පියස්ස පාමුල සිට රටේ දූ දරුවන් ඇතුළු පිරිස සමඟ සම්බන්ධව ලොවක් දිනන්න සැලසුම් රැසක් ක්‍රියාත්මක කර තිබේ. මෙහිදී සන්නිවේදනයට ලබා දී ඇත්තේ ප්‍රමුඛත්වයකි. සන්නිවේදනයෙන් බොහෝ ප්‍රතිහාර්යයන් සිදු කළ හැක. මේ සඳහා මූලික අධ්‍යයන ආයතනයේ විද්‍යා අධ්‍යාපන හා ව්‍යාප්ති අංශයක් වෙනනම ස්ථාපිත කොට ඇත. විද්‍යා විෂය කෙරෙහි කුතුහලයක් සහ ආස්වාදයක් ජනිත කරවීමත් විද්‍යාව හැදෑරීමෙන් දේශීය උන්නතිය සඳහා නව මංපෙත් විවර කරගැනීමත් අරමුණු කොට රටේ අනාගත පෙර ගමන්කරුවන් වන සිසු පරපුර උදෙසා වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කර තිබේ.

මේ කර්තව්‍ය සාක්ෂාත් කරගැනීමට විද්‍යා අධ්‍යාපන හා ව්‍යාප්ති අංශය මගින් දිවයින පුරා සිටින පාසල් ගුරුභවතුන් සහ සිසු දරු දැරියන්ට අධ්‍යාපනික වැඩමුළු, අධ්‍යාපනික ප්‍රදර්ශන, දීප ව්‍යාප්ත තරග, විද්‍යා දේශන, විද්‍යා පුහුණු සැසි යනාදිය ක්‍රියාත්මක කෙරේ. මෙහි ඉතා ප්‍රකට වැඩසටහනක් වන්නේ වසර ගණනාවක් මුළුල්ලේ ක්‍රියාත්මක වන පාසල් විද්‍යා වැඩමුළුව අපොස සාමාන්‍ය පෙළ විභාගයේ විශිෂ්ට ප්‍රතිඵල ගන්නා රට පුරා විසිරී ඇති සිසු දරු දැරියන් ඒකරාශි කරගනිමින් එයින් තෝරාගනු ලබන සිසුන් හට වාර්ෂිකව පවත්වනු ලබන අතර මෙමගින් නිර්මාණශීලි ඇසකින් විද්‍යාව දැකීමටත් මතු අනාගතයේ මෙරට විද්‍යා විෂයේ අභිවෘද්ධිය සඳහා කැපවන පරපුරක් නිර්මාණය කිරීමටත් දායකත්වය ලබාදීම ප්‍රධානම අරමුණයි. මෙමගින් පෝෂණය වූ ශ්‍රී ලාංකේය දූ දරුවන් ලොව පුරා විද්‍යාඥයන් ලෙස විශාල සේවාවක් ඉටු කරයි.

තවද අපොස උසස් පෙළ විභාගයට මුහුණ දී විශ්ව විද්‍යාල වරම් අපේක්ෂාවෙන් සිටින දරුවන් උදෙසා නවක පර්යේෂණකරුවන් විසින් වැඩසටහනක් ක්‍රියාත්මක කොට තිබේ. ඔවුන් එහිදී විද්‍යාව කෙරෙහි දක්වන ඇල්ම හා කුතුහලයට පිළිතුරු මේ පියසෙන් ලබා ගනිමින් තම ජීවන මාවත විද්‍යාව ඔස්සේ ඉදිරිය සකසා ගනිමින් විවිධ වෘත්තීන්ගේ පරතෙරටම ගොස් ලොව පුරා නොයෙක් ක්ෂේත්‍රයන්හි නියැළී සිටී.



**ජාතික අධ්‍යයන ආයතනයේ අධ්‍යක්ෂ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සමන් සෙනවීර**

නවීන තාක්ෂණය සමඟ යාවත්කාලවීම මෙහි නිරතුරුව සිදු වන්නකි.මෙහි ප්‍රතිඵලයක් ලෙස 2012 වසරේ ආරම්භ කරන ලද දකුණු ආසියාවේ ප්‍රථම විද්‍යා කෙටි පණිවිඩ සේවාව ආරම්භ කිරීම ජාතික මූලික අධ්‍යයන ආයතනයේ සුවිශේෂී ජයග්‍රහණයකි. මෙය 2014 වසරේ ඉ ස්වාභිමානී සම්මාන උලෙළේ ජූරියේ විශේෂ සම්මානයට පාත්‍ර විය. ලක්ෂයකට අධික ප්‍රමාණයකට සේවාව සපයා ඇති මේ කෙටි පණිවිඩ සේවාව සමඟ ශ්‍රී ලංකාවේ වෙසෙන විද්වතුන්, වෘත්තියවේදීන්, ගුරුභවතුන් මෙන්ම අපගේ සිසු පරපුරද අත්වැල් බැඳගෙන සිටිති.

ශ්‍රී ලංකාවේ ප්‍රථම සිංහල විද්‍යා වෙබ් අඩවිය ලෙස ගෞරවයට පාත්‍ර වූ "විදු මන්පෙත" වෙබ් අඩවියද මෙහි සුවිශේෂී ක්‍රියාදාමයකි. විද්‍යා විෂය සම්බන්ධව තතු සෙවීමේදී විශාල වුවමනාවකින් පෙළෙන දරු දැරියන්ට හෙළ බසින්ම විදු දැනුම ගවේෂණය කිරීමටත් සරලත්වයෙන් මුසු ප්‍රායෝගික විද්‍යා සංචාරයක යෙදීමටත් විදු මංපෙත කදිම තෝ තැන්නකි. මේ වෙබ් අඩවියේ ඇති විශිෂ්ටත්වය නිසාම 2012 වසර සඳහා වූ ස්වාභාමානී ජාතික තොරතුරු තාක්ෂණ සම්මාන උලෙළේදී මෙය ජූරියේ විශේෂ සම්මානයෙන්ද පිදුම් ලැබීය.

නව විෂය ක්ෂේත්‍ර කරා මෙරට සිසු දරුවන් අවතීර්ණ කරවීමට වුවමනා වන නිවැරදි පදනමක් සැකසීම සඳහා විශාල ප්‍රයත්නයක දරණ මේ ආයතනය අලුතින්ම විෂය නිර්දේශයට හඳුන්වා දෙනු ලබන විෂයයන් පිළිබඳ ගුරු පුහුණු වැඩමුළු මෙන්ම ඔවුන්ගෙන් අධ්‍යාපනය ලබන සිසු සිසුවියන්ට සරල මුහුණුවරකින් නව ක්‍රමෝපාය මගින් විෂය ක්ෂේත්‍ර පහදාදීම පිළිබඳ වැඩසටහන් විශාල ප්‍රමාණයක් රටපුරා ක්‍රියාත්මක කරනු ලබයි.

**ශ්‍රී ලාංකික දරු දැරියන් විද්‍යා දැනුමෙන් පුබුදු කිරීම අරමුණයි**

පාසලේ විද්‍යා විෂය ඉගෙන ගැනීමේදී ප්‍රායෝගික පරීක්ෂණවලට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. එහෙත් බොහෝ පාසල්වල ප්‍රායෝගික පරීක්ෂණ සිදු කිරීමට ගැටලු රාශියක් තිබේ. අද වන විට බොහෝ සිසුන් හට අන්තර්ජාල පහසුකම් හරහා දැනුම ලබාගත හැකි වුවත් එය ඉංග්‍රිසි මාධ්‍යයෙන් තිබීමත් එහි අන්තර්ගතය දේශීය විෂය නිර්දේශවලට නොගැලපීම මෙන්ම සංකීර්ණ බව වැනි කරුණු හේතුවෙන් ඒවා අදාළ කරගැනීමේ ප්‍රශ්නාර්ථයට ගුරුභවතුන් මෙන්ම සිසුන්ද මුහුණ දෙනු ලබයි.

එදිනෙදා ජීවිතයේදී විද්‍යා දැනුම භාවිතයට එකතු කර ගැනීමේ වැදගත්කම අරමුණු කර ගනිමින් පාසල් දරුවන් අතර විද්‍යාත්මක සංකල්ප සහ එහි යෙදීම් හඳුනාගැනීමෙන් සිසුන්ට විද්‍යාව කෙරෙහි ආශාවක් මෙන්ම කුතුහලයක් ඇති කිරීම මූලික කර ගනිමින් දීප ව්‍යාප්ත ද්වි භාෂා තරගාවලි පැවැත්වීමටද මේ ආයතනය ප්‍රමුඛත්වයක් දී කටයුතු කරයි. මේ සඳහා ශ්‍රී ලාංකික දරු දැරියන් විශාල ප්‍රමාණයක් සිය නිර්මාණ ඉදිරිපත් කරයි. බොහෝ සිසු දරු දැරියන් ශ්‍රී ලංකාවේ මෙවැනි තැනක් තිබෙන බව දැන ගන්නේ මෙවැනි තරගාවලිවලට ඉදිරිපත් වීමෙනි.

ශ්‍රී ලාංකික දරු දැරියන් විද්‍යා දැනුමෙන් පුබුදු කරවමින් මෙරටට අවශ්‍ය විද්‍යාඥයන්, වෘත්තියවේදීන් මෙන්ම නව දැක්මක් ඇති පරපුරක් බිහි කරවීමට ජාතික මූලික අධ්‍යයන ආයතනයේ විද්‍යා අධ්‍යාපන හා ව්‍යාප්ති අංශය මගින් සිදු කරන සේවාව විධිමත් සහ ක්‍රමවත් කිරීමට දැඩි කැපවීමකින් යුතුව කටයුතු කරන එම අංශයේ අංශ ප්‍රධානී කුමාරි තිලකරත්න මහත්මියගේ නිර්මාණශීලි සේවාවත් එම භාරධූර කාර්යයන්හිදි සහාය සපයන නිලධාරි මණ්ඩලයත් සියලු කටයුතුවලට මාර්ගෝපදේශ සපයන ජාතික අධ්‍යයන ආයතනයේ අධ්‍යක්ෂ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සමන් සෙනවීර මහතාගේ සේවාවත් අගය කළ යුතුය.

https://www.nifs.ac.lk/ ජාතික මූලික අධ්‍යයන ආයතනයේ නිල වෙබ් අඩවියයි.

**සටහන සහ ඡායාරූප - ඉන්ද්‍රාණි තෝරදෙනිය**